# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail: *psc.cp.gov@gmail.com*

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |


මගේ අංකය / எனது இல. / My No.: සීපීසී/පීඑස්සී/9/10

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2021.09. 28

මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත

## <u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විමසන ලදුව පහත පරිදි දන්වා එවා ඇත.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 බලාත්මක දිනය වන 2020.10.16 දින තෙක් බලපැවැත්වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා 01/2014 (IV), 01/2014 (VIII) අනුව, භාෂා පාඨමාලාවක් හැදෑරීම මත, රාජ්‍ය නිලධාරියෙකු භාෂා ප්‍රවීණතාවෙන් නිදහස් කිරීමේ අවකාශ පැවතියේ, එකී චක්‍රලේඛයෙහි එනම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි 03.III.(ඇ), 03.IV(ආ) අනුව සහ 01/2014(IV) හි 02(අ) පරිච්ඡේද අනුව පමණි.

II. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන ප්‍රකාරව, 03 වන කාණ්ඩය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හෝ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මගින් හෝ එහි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරුණු පැය 150 භාෂා පාඨමාලාවක්, සේවාරම්භක පුහුණුවේ කොටසක් ලෙස සම්පූර්ණ කර ඇත්නම්, එකී නිලධරයන් භාෂා ප්‍රවීණතාවෙන් නිදහස් කළ හැකිය.

III. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 බලාත්මක දිනය, එනම් 2020.10.16 දින වන විට උක්ත II හි සඳහන් නිලධරයන් එකී පාඨමාලා සම්පූර්ණ කර ඇත්නම්, එම නිලධාරීන් කිසිම ගැටළුවකින් තොරව භාෂා ප්‍රවීණතාවෙන් නිදහස් කළ හැකිය. (ඒ සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 03.04 ඡේදය කෙරෙහි අවධානය යොමු කර ඇත.)

IV. තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 02 පරිච්ඡේදයෙහි දක්වා ඇති භාෂා පාඨමාලා, එම චක්‍රලේඛය බලාත්මක දිනයට පසු, නව විෂය නිර්දේශානුකූලව සම්පාදිත පාඨමාලා වන අතර එහි දක්වා ඇති නිලධරයන් වර්ගීකරණය, ඒ ඒ නිලධාරීන්ගේ වැටුප් කාණ්ඩ අනුව, නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇති බැවින්ද, එකී වර්ගීකරණය මෙම චක්‍රලේඛයන් නිකුත් වීමට පෙර පැවති චක්‍රලේඛයන්හි තිබූ වර්ගීකරණයන් හා සැසඳිය නොහැකි බව.

02. ඒ අනුව, රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව භාෂා පාඨමාලාව සනාථ කර ගැනීම සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධව ඔබ යටතේ පවතින ආයතනවල සේවයේ නිරත සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

03. තවද, 2021.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2021 අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දනවමි.

ටී.ඒ.ඩී.ඩබ්. දයානන්ද
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.